**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයට සිසුන් බඳවා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය**

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනු ඇත්තේ පරීක්ෂණ මණ්ඩල 04 කින් දෙනු ලබන ලකුණුවල එකතුවක් හැටියටය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ස්වාධීන ලකුණු ලැයිස්තුව බැගින් ලබාදිය යුතුය. ඒ සඳහා විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර ප්‍රවීණයන්ගෙන්ද පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව කථා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු දෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 20ක් හෝ ඊට වැඩිය. විනිවිධභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ඨ කිරීම පිණිස මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

## (1) පළමු පරීක්ෂණය

ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳ පොදු ප්‍රායෝගික දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ. නියම කරනු ලබන කාල වේලාව තුළ පරීක්ෂණ මණ්ඩලය දෙනු ලබන නර්තන අංග තුනක් අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඉදිරිපත් කළ යුතුය. එකී අංග උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් විය යුතුය. එක් එක් නර්තන අංගයක් සඳහා මිනිත්තු 04 ක් බැගින් නර්තන, ගායන හා වාදන අංග 05 සඳහා උපරිම කාලය මිනිත්තු 20 කි.

**ඇගයීම**

| | | | | |
|---|---|---|---|---|
| i | නර්තන සම්ප්‍රදායන් අනුව නිවැරදි අංග චලන ඉදිරිපත් කිරීමේ ශක්‍යතාවය | | | |
| | | උඩරට නර්තන සම්ප්‍රදාය | - | 10 |
| | | පහතරට සම්ප්‍රදාය | - | 10 |
| | | සබරගමු සම්ප්‍රදාය | - | 10 |
| ii | නර්තනයේ දී ශරීරාංග වලින් හා මුහුණින් ප්‍රකාශිත භාව ප්‍රකාශන ගුණය | | - | 05 |
| iii | ගායන සහ වාදන ඉදිරිපත් කිරීමේ හැකියාව | | - | 05 |
| | | | | 40 |

## (2) දෙවන පරීක්ෂණය

අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් තමන් වඩාත් කැමති හෝ ප්‍රගුණ කර ඇති සම්ප්‍රදායන් පිළිබඳ කුසලතාවය මෙහිදී පරීක්ෂාවට ලක්කෙරේ. එහිදී උඩරට, පහතරට, සබරගමු, ඉන්දියානු නර්තන හෝ බෙර වාදන ඉදිරිපත් කළ හැකිය. උපරිම කාලය මිනිත්තු 10යි.

**ඇගයීම**

| | | | |
|---|---|---|---|
| i | නර්තන සම්ප්‍රදාය අනුව නිවැරදි අංගහාර ඉදිරිපත් කිරීම හෝ බෙර වාදන ශක්‍යතාවය | - | 10 |
| ii | ශරීර චලනයේ රිද්මයානුකූල හා තාක්ෂණික නිරවද්‍යතාවය | - | 10 |
| iii | තාලාවබෝධය හා රිද්මීය ගුණය | - | 10 |
| iv | නර්තන හා වාදනයේ දී ශරීර අංග වලින් හා මුහුණින් ප්‍රකාශිත භාව ප්‍රකාශන ගුණය | - | 10 |
| | | | 40 |

## (3) තෙවන පරීක්ෂණය - වාචික

**ඇගයීම**

- i වාචික පරීක්ෂණයේ දී සමාජ සංස්කෘතික පරිසරය පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය විමසීම
- ii නර්තනය පිළිබඳ අපේක්ෂකයාගේ ආකල්ප විමසීම
- iii අපේක්ෂකයාගේ අභිලාස හා බලාපොරොත්තු විමසීම
- iv සිනමා, රූපවාහිනී මාධ්‍ය පිළිබඳ අවබෝධය

ඉහත කරුණු මුල්කරගෙන නර්තනය පිළිබඳ සාමාන්‍ය දැනීම ඇගැයීම පිණිස අසනු ලබන කෙටි ප්‍රශ්න වලින් අපේක්ෂකයන් සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවය නිරීක්ෂණය කරනු ලැබේ. වාචික පරීක්ෂණය සඳහා එක් අයෙකුට උපරිම කාලය මිනිත්තු 10 කි. ලබාදිය යුතු උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.

## (4) සිව්වන පරීක්ෂණය

කැඳවනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඔවුන්ගේ කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා ඔවුන් විසින් දිනා ඇති විවිධ සහතික, පදක්කම් හා ප්‍රසංග සඳහා ලැබී ඇති ප්‍රශංසනාත්මක ලිපි සමග තමන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රසංග වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් (Portfolio) සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන ආ යුතුය.

දේශීය මට්ටමේ හැකියාවන් සඳහා ප්‍රථම ස්ථානයකට එක් ලකුණක් ද ඉතිරි ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට ද ජාත්‍යන්තර මට්ටමේ දිනා ඇති පදක්කම් හෝ සහතිකපත් සඳහා ප්‍රථම ස්ථානයකට ලකුණු දෙකක් ද වශයෙන් අනෙකුත් ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට උපරිම ලකුණු 10 ක් සිව්වන පරීක්ෂණයේ දී ප්‍රදානය කෙරේ.

උදාහරණ ලෙස, ලකුණු ලබාදීම සඳහා සළකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

ජාතික නැටුම් පිළිබඳ විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අවසාන සහතික පත්‍රය.
රජයේ පිළිගත් අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය හෝ ජාතික තරුණ සේවා සභාව වැනි ආයතන මගින් පවත්වනු ලබන අවුරුද්දකට නොඅඩු නර්තන, ජනමාධ්‍ය, ජනසන්නිවේදන පාඨමාලා සඳහා

**ඒක පුද්ගල ඉදිරිපත් කිරීම් ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීම ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**ජාත්‍යන්තර තලය**

**ඒකපුද්ගල ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

**කණ්ඩායම් මට්ටමින් ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

කුසලතා ඇගයීමේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පෙර වර්ෂ 3කට අදාළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පසු වර්ෂයකට අදාළ කුසලතා සහතික පමණක් සළකා බලනු ලැබේ.

## (5) අභියෝග්‍යතා පරීක්ෂණයේ පරීක්ෂණ මණ්ඩල සංයුතිය

එක් එක් පරීෂණ මණ්ඩල සඳහා වෙන වෙනම කණ්ඩායම් ඇතුළත් වේ. අංශප්‍රධාන හැර වෙනත් අයට මණ්ඩල දෙකක් නියෝජනය කළ නොහැකිය. පරීක්ෂණ මණ්ඩල 04 සඳහා එක් එක් අපේක්ෂකයා/අපේක්ෂිකාව එක් දිනක් තුළ මුහුණ දිය යුතුය.

එක් අපේක්ෂකයකුට පරීක්ෂණ මණ්ඩල 04 සඳහා දිනකට මුහුණ දීමට ගතවන කාලය අනුව දිනකට කැඳවන අපේක්ෂක/අපේක්ෂිකාවන් ප්‍රමාණය පීඨය විසින් තීරණය කළ යුතුය.

**පළමු පරීක්ෂණ මණ්ඩලය**

i උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් අයත් අධ්‍යයනාංශ ප්‍රධානවරුන් හෝ අංශප්‍රධාන විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගේ ඉහල ශ්‍රේණිවල තිදෙනෙක් - 03

ii බාහිර විෂය ප්‍රවීණයන් තිදෙනෙක් - 03

iii එක් එක් අධ්‍යයනාංශය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හෝ ඉන් ඉහළ ශ්‍රේණියේ දෙදෙනෙකු - 02

**දෙවන පරීක්ෂණ මණ්ඩලය**

i අදාළ අධ්‍යයනාංශ ප්‍රධාන හා අදාළ සම්ප්‍රදායේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරුන් හෝ ඉන් ඉහල ශ්‍රේණියේ දෙදෙනෙක් - 02

ii බාහිර විෂය ප්‍රවීණයන් තිදෙනෙක් - 03

iii එක් එක් අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හෝ ඉන් ඉහල ශ්‍රේණියේ දෙදෙනෙක් - 02

**තෙවන පරීක්ෂණ මණ්ඩලය**

i පීඨ මණ්ඩලය නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් දෙදෙනෙක් - 02

ii එක් එක් අධ්‍යයනාංශයේ ආචාර්යවරුන් අතරින් දෙදෙනෙකු - 02

**සිව්වන පරීක්ෂණ මණ්ඩලය (සහතික පරීක්ෂාව)**

ලේඛකාධිකාරී හෝ ඔහු විසින් නම් කරනු ලබන පරිපාලන නිලධාරීවරයෙකු, පීඨයේ සහකාර ලේඛකාධිකාරී හා අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේ සහකාර ලේඛකාධිකාරී හෝ නියෝජිතයකු

සම්පූර්ණ පරීක්ෂණ මණ්ඩල සාමාජිකත්වය 20කි. මෙම පරීක්ෂණ මණ්ඩලවලට ඒ ඒ පීඨයන් නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් හෝ ඒ හා සමාන්තර විෂය ප්‍රවීණයන් ඇතුලත් විය යුතුය. පරීක්ෂක මණ්ඩල සංයුතිය සඳහා පීඨ මණ්ඩලයේ හා සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුය. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉහත දක්වා ඇති සියලු පරීක්ෂණ වලින් ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයේ එකතුව ලකුණු 50 කි.

ඉහත නිර්ණායක සහ ක්‍රමවේදය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් චන්ද්‍රජීව**
**උපකුලපති**

පිටපත - පීඨාධිපති/නර්තන හා නාට්‍ය කලා පීඨය
සහකාර ලේඛකාධිකාරී/නර්තන හා නාට්‍ය කලා පීඨය